# සාමාන්‍ය සමයේ විසිඅටවන සතිය
# සඳුදා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුළු තුමන් විසින් රෝමවරුන් වෙත ලියන ලද හසුනෙන් කොටසකි.

රෝම 1 : 1–7

ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ දාසයෙකු වන, උන් වහන්සේගේ සුබ අස්න දේශනා කිරීම පිණිස අපෝස්තුළුවරයකු වීමට දේව වරමින් කැඳවීම ලත් පාවුළු වෙතිනි.

බොහෝ කලකට පෙර දෙවියන් වහන්සේ ස්වකීය දිවැසිවරයන් මගින් ඒ සුබ අස්න ගැන ශුද්ධ ලියවිල්ලෙහි පොරොන්දු දුන් සේක. ඒ සුබ අස්න උන් වහන්සේගේ පුත්‍ර වූ අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳව ය. පරපුර අනුව බලන විට උන් වහන්සේ දාවිත් රජුගේ පෙළපතෙහි උපන් සේක. එහෙත්, ලෝකෝත්තර වශයෙන් මරණයෙන් උත්ථාන වීම හේතුකොටගෙන දේව පුත්‍රයාණන් බවට ප්‍රබල සාක්ෂියක් වූ සේක.

සියලු ජාතීන් ඇදහිල්ලට පමුණුවන පිණිස ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් අපෝස්තුළුවරයකු වීමේ වරම මම උන් වහන්සේ අතින් ලදිමි. ක්‍රිස්තුස් වහන්සේගෙන් කැඳවීම ලත් බැවින්, ඔබ ද ඒ ඇදහිලිවතුන්ගේ සංඛ්‍යාවට අයිති ය. දෙවියන් වහන්සේට ප්‍රිය වූ, උන් වහන්සේට කැප කරන ලද සෙනඟක් වන රෝමයෙහි සිටින ඔබ හැම දෙනා වෙත මෙය ලියා එවමි. අපගේ පියාණන් වන දෙවියන් වහන්සේගෙන් ද ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගෙන් ද කරුණාවත් ශාන්තියත් ඔබට වේවා!

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 98 : 1 – 4

පිළිතුර: සමිඳාණෝ ස්වකීය ජයග්‍රහණය ප්‍රකාශ කළ සේක.

ගීය:

සමිඳුන්ට නව ගීයක් ගයන්න. මන්ද, එතුමාණෝ අසිරිමත් ක්‍රියා කළ සේක. සිය බලයෙන් හා ශුද්ධ ශක්තියෙන් ජයග්‍රහණය ලත් සේක. සමිඳාණෝ ස්වකීය ජයග්‍රහණය ප්‍රකාශ කළ සේක.

විජාතීන්ගේ ඇස් හමුයෙහි සිය විමුක්ති බලය එළිදරව් කළ සේක. එතුමාණෝ ඉශ්රායෙල් වංශය කෙරෙහි එතුමන්ගේ ප්‍රේමයත්, විශ්වාසවන්තකමත් සිහි කළ සේක.

මිහි පිට සියලු දෙන අප දෙවිඳුන්ගේ ජයග්‍රහණය දුටුවෝය.
එම්බා ලෝවැසි සියල්ලෙනි, සමිඳුන් හට ප්‍රීතියෙන් ගී ගයන්න. ප්‍රීති ගී ගයමින් එතුමන් පසසන්න.

## සුප්‍රවෘත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, ඔබේ මහ කරුණාව ලෙස මා පණගැන්වුව මැනව.
එවිට මම ඔබ වදාළ ශික්ෂා පද පිළිපදින්නෙමි.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
අපේ සිත් දැඩිකර නොගෙන
සමිඳාණන් පවසන දෙයට සවන් දෙමු.
ආලේලූයා!

# සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 11: 29-32

"ජෝනා හැර වෙන හාස්කමක් ඔවුන්ට නොදෙනු ඇත."

සමූහයා තමන් වහන්සේ වෙත රැස් කකා එද්දී ජේසුස් වහන්සේ මෙසේ වදාළ සේක. "මේ පරම්පරාව නපුරු එකකි. ඔව්හු හාස්කමක් සොයති. එහෙත් ජෝනා හැර වෙන හාස්කමක් ඔවුන්ට නොදෙනු ඇත. ජෝනා නිනිවයේ වැසියන්ට යම් සේ ලකුණක් වී ද එසේම මනුෂ්‍ය පුත්‍රයාණෝ මේ පරම්පරාවට ලකුණක් වන සේක. දේව විනිශ්චය දවසේ දී දකුණු දිශාවේ රැජින මේ පරම්පරාවේ මනුෂ්‍යයන්ට විරුද්ධ නැගිට ඔවුන් වරදට පත් කරන්නීය.

ඇ සලමොන් ගේ ප්‍රඥාව අසනු වස් පොළොවේ සීමාන්තවල සිට පැමිණියා ය. බලන්න, සලමොන්ට වඩා ශ්‍රේෂ්ඨයෙක් මෙහි සිටියි. නිනිවයේ මනුෂ්‍යයෝ විනිශ්චය දවසේ දී මේ පරම්පරාව සමඟ නැගී සිට ඔවුන් වරදට පත් කරන්නෝය. මන්ද, ජෝනාගේ ධර්ම දේශනා අසා ඔව්හු මනස්ථාපනය වූහ. බලන්න, ජෝනාට වඩා ශ්‍රේෂ්ඨ කෙනෙක් මෙහි සිටිති."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.